// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1946/2 - 2015 දෙසැම්බර් මස 21 වැනි සඳුදා - 2015.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ මාතර මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ධූරයේ පුරප්පාඩුව පිරවීම

නියෝජ්‍ය නගරාධිපති, නගරාධිපති ධූරයට පත්වීම හේතු කොට ගෙන මාතර මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වන වගන්තිය යටතේ තනතුර දැරූ නියෝජ්‍ය නගරාධිපති වන දීගොඩ ගමගේ යසරත්න අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ මාතර මහ නගර සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා කොඩිප්පිලි යක්දෙහියගේ හරීන්ද්‍ර රුවන් චින්තක මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මාතර මහ නගර සභාවේ තේරීම් භාර නිලධාරි වේවැල්ලවල හේවගේ රවීන්ද්‍ර විජය කුමාර වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කොඩිප්පිලි යක්දෙහියගේ හරීන්ද්‍ර රුවන් චින්තක මහතා මාතර මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඩබ්. එච්. ආර්. විජය කුමාර,
තේරීම් භාර නිලධාරී,
මාතර මහ නගර සභාව.

2015 දෙසැම්බර් මස 21 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතර.

01 - 269

1A - G 22739— 21 (2015/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.